ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළ කළමනාකරුවන් පිරිසක් සඳහා ඉන්දියාවේදී ධාරිතා සංවර්ධන වැඩසටහනක්

ශ්‍රී ලංකා ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා පෞද්ගලික සමාගමේ (AASL) ගුවන් තොටුපොළ කළමනාකරුවන් 10 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් 2026 මාර්තු 09-20 දක්වා නව දිල්ලි නුවර ඉන්දීය ගුවන් සේවා ඇකඩමියේ (IAA) පැවති විශේෂ ධාරිතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වූහ.

2. AASL සමාගම ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපොළවල් කළමනාකරණය සහ සංවර්ධනය කිරීමට ව්‍යවස්ථාපිතව බලගන්වා ඇති සමාගමකි. ඉන්දීය ගුවන් සේවා ඇකඩමිය ගුවන් සේවා ක්ෂේත්‍රයේ අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක් වන අතර එය ඉන්දීය ගුවන් තොටුපොළ අධිකාරිය, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය සහ සිවිල් ගුවන් සේවා ආරක්ෂක කාර්යාංශය යන ආයතනයන්හි ඒකාබද්ධ පුහුණු ඇකඩමියක් වේ. ICAO TRAINAIR PLUS වැඩසටහනේ පූර්ණ සාමාජිකයකු වන IAA ඇකඩමිය ගුවන් සේවා ක්ෂේත්‍රයේ සියලු අංශ ආවරණය කරන පුහුණු ක්‍රියාකාරකම් සමඟින් අත්දැකීම් ඇසුරෙන් ඉගෙන ගැනීමට අවස්ථාව සලසන සංස්කෘතියක් දිරිමත් කරයි.

3. දෙසතියක් පුරා පැවති වැඩසටහන තුළින් සහභාගීවන්නන්ට පර්යන්ත මෙහෙයුම්, මගී පර්යන්ත සැලසුම්කරණය සහ කළමනාකරණය; ගුවන් තොටුපොළ අභ්‍යන්තර ප්‍රදේශ කළමනාකරණය කිරීමේ ක්‍රමෝපායන්; ගුවන් ගමන් වාර කළමනාකරණය, මගීන් සඳහා පහසුකම් සැලසීම; ගුවන් සේවා සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව; ගුවන් යානා යථා තත්ත්වයට පත් කිරීම සහ උපකරණ; අර්බුද කළමනාකරණය සහ හදිසි තත්ත්වයන්ට මුහුණ දීම, ව්‍යාපාර අඛණ්ඩතාවය සැලසුම් කිරීම ඇතුළු ගුවන් සේවා ක්ෂේත්‍රයේ විවිධ අංශ සම්බන්ධයෙන් දැනුම සහ අවබෝධය ලබා දෙන ලදි.

4. මෙම වැඩසටහන ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය තුළ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දැනට ක්‍රියාත්මක ද්විපාර්ශ්වික සහයෝගීතා රාමුව යටතේ සංවිධානය කර තිබිණ. මෙම සහයෝගීතාවය ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් සිය 2025 අප්‍රේල් ශ්‍රී ලංකා නිල සංචාරය අතරතුර සිදු කළ නිවේදනය පරිදි ශ්‍රී ලාංකික

වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් සමඟින් තවත් ඉහළ නංවන ලදි. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ 2024 දෙසැම්බර් නිල ඉන්දීය සංචාරය අතරතුර ඉන්දියාවේ යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් යටතේ වාර්ෂිකව ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 300කට ආසන්න පිරිසක් ද ඉන්දියාවේ පුහුණු වැඩසටහන් සඳහා යොමු කෙරේ.

***

***කොළඹ***
***2026 මාර්තු 21***